# දරුවන් උදෙසා බයිබලයක්

# දෙවියන් වහන්සේ ආබ්‍රහම් හට දුන් පොරොන්දුව



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Byron Unger; Lazarus
Alastair Paterson

සකස්කරන්නා: M. Maillot; Tammy S.

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර
ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

මහා ගංවතුරෙන්
බොහෝ කලකට
පසු, පොලෝ තලයේ
මිනිස්සු සැලැස්මක්
ක්‍රියාත්මක කළෝය.





“අපි ස්වර්ගය දක්වා දිවෙන කුළුණක්
සහිත මහා නගරයක් ගොඩනගමු
යැ” යි ඔවුහු කීවෝය. එලෙසම
ඔවුහු, “අපි සැම විටම එකට ජීවත්
වෙමු” යි කතා කරගත්තෝය.
සැවොම එකම භාෂාවක්
කතා කළෝය.

මිනිසුන්, තමන්වහන්සේ විසින් මවන ලද ලෝකය සිසාරා ජීවත් වීම, දෙවියන් වහන්සේට අවශ්‍ය විය. එනිසා දෙවියන් වහන්සේ විශේෂ දෙයක් කළ සේක. හදිසියේම, මිනිස්සු කණ්ඩායම් ලෙස වෙනස් වෙනස් විදියට කතා කරන්නට වූවෝය. දෙවියන් වහන්සේ ඔවුන්ට අලුත් භාෂාවන් දුන් සේක.



එකම භාෂාව කතා කළ අය එකට එක්වූවෝය. සමහරවිට ඔවුන්, සෙසු අය ඔවුන්ව තේරුම් නොගනී යැයි බිය වූවා විය හැක. මේ ආකාරයට දෙවියන් වහන්සේ මිනිසුන්, විවිධ රටවල් ලෙසින් පුරවන්නට යොදාගත් සේක. ඔවුන් හැර ගිය නගරයේ නම



ව්‍යාකූලත්වය නම් අරුත ඇති බාබෙල් ය.

වසර කිහිපයකට පසු,
කල්දිවරුන් ගේ
දේශයේ උගර් නම්
ස්ථානයේදී, දෙවියන්
වහන්සේ ආබ්‍රම්  නම්
මනුශයයෙකුට කතා
කළ සේක. "මේ
දේශයෙන් පිටත්ව
යන්න," කියා දෙවියන්
වහන්සේ අණ කළ
සේක. "මම ඔබට
පෙන්වන දේශයට
යන්න."



ආබ්‍රම් කීකරු විය. දෙවියන් වහන්සේ ඔහු කානාන් දේශයට ගෙන ගිය සේක. ඔහුගේ බිරිඳ සාරායි සහ ඔහුගේ ඥාති පුත්‍ර වූ ලොත්ද ඔහු සමඟ ගියෝය.



කානාන් හීදි ආබ්‍රම් සහ ලොත් යන දෙදෙනාම ධනවත් වූවෝය. විශාල ගව පට්ටි ඔවුන් සතුව තිබුණි. ඔවුන්ගේ බොහෝ සතුන් සඳහා ප්‍රමාණවත් තණබිම් තිබුණේ නැත.



ලොත්ගේ එඬේරු ආබ්‍රම් ගේ
එඬේරුන් සමඟ රණ්ඩු වූවෝය.
“මෙතැන කිසිම ප්‍රශ්නයක් නොතිබිය
යුතුයි” යි ආබ්‍රම් පැවසීය. “අපි වෙන්
වෙමු. ලොත්, ඔබට අවශ්‍ය ප්‍රදේශය
පළමුව ඔබම තෝරා ගන්න.”



ලොත්, නගර හා ගම්මාන සහිත
සරුසාර තණබිමක් තෝරා ගත්තේය.
එය පෙනුමින් යහපත්ව තිබුණි. එහෙත්
එම නගර ඉතා දුෂ්ට ස්ථාන විය.





ලොත් පිටව ගිය පසු දෙවියන් වහන්සේ ආබ්‍රම්ට නැවත කතා කළසේක. "මම කානාන් දේශයේ සියලුම බිම් ඔබටත් ඔබේ දරුවන්ටත් සදහටම දෙන්නෙමි." ආබ්‍රම්ට සහ සාරායිට දරුවන් සිටියේ නැත. දෙවියන් වහන්සේ එතුමාණන්ගේ ශ්‍රේෂ්ඨ

පොරොන්දුව ඉටු කරන්නේ කෙසේද?

දෙවියන්
වහන්සේ



වෙතින් මිනිස්සු තුන් දෙනෙක්
ආබ්‍රම් සහ සාරයි වෙත පැමිණියෝය.
"ඔබට ඉක්මනින්ම දරුවකු ලැබේවි," ඔවුහු කීවෝය.
සාරයි සිනාසුණාය. ඇය දෙවියන් වහන්සේගේ පණිවිඩය
විශ්වාස කළේ නැත. ඇයට වයස අවුරුදු අනූවක් විය.



දෙවියන් වහන්සේ, ආබ්‍රම්ට දැන් පටන් ආබ්‍රහම් (බොහෝ දෙනෙකුගේ පියා) යන නාමය තබන බවද, සාරායි, සාරා (කුමරිය) වනු ඇතැයිද පැවසූ සේක.

දෙවියන් වහන්සේ සොදොම් සහ ගොමෝර්‍රා යන දුෂ්ට නගර විනාශ කරන්නට යන බව ආබ්‍රහම්ට වදාළ සේක. ආබ්‍රහම්ගේ ඥාති පුත්‍ර ලොත් ඔහුගේ පවුලේ අය සමඟ සොදොම්හි ජීවත් වූහ.



ලොත් දෙවියන් වහන්සේගේ අනතුරු ඇඟවීම පැමිණි විට එය විශ්වාස කළ නමුත් ඔහුගේ දියණියන්ගේ ස්වාමි පුරුෂයන් සොදොම් හැර යාම ප්‍රතික්ෂේප කළහ. කෙතරම් ශෝකජනකද? ඔවුහු දෙවියන් වහන්සේගේ වචනය විශ්වාස නොකළෝය.



ලොත් සහ ඔහුගේ දියණියන්
දෙදෙනා පමණක් ආරක්ෂිතව
ගැලවුනෝය. දුෂ්ට නගර
මතට ගිනි සහ ගෙන්දගම්
පතිත වුනි.



කනගාටුදායක ලෙස, ලොත්ගේ බිරිඳ
දෙවියන් වහන්සේගේ අවවාදයට
අකීකරු වී, දිව යන අතර ආපසු
හැරී බැලුවාය. ඇය
ලුණු කණුවක් බවට
පත් වූවාය.



සමිදාණන් වහන්සේ
ආබ්‍රහම්ට සහ සාරාට
දුන් පොරොන්දුව ඉටු
කළ සේක. ඔව්හු
දෙවියන් වහන්සේ
පැවසූ පරිදිම
ඔවුන්ගේ මහලු
වියේදී දරුවෙකු
ලැබුවෝය. ඊසාක්
ඉපදුණු විට ඔවුන්
කෙතරම් ප්‍රීති
වන්නට ඇතිද?





සමහරවිට
ආබ්‍රහම් පවා දෙවියන්
වහන්සේගේ පොරොන්දුව
වන, ඔහුටත් ඔහුගේ
දරුවන්ටත් සදහටම
කානාන් දේශය හිමි වීම
ගැන සිතන්නට ඇත.
දෙවියන් වහන්සේ එම
පොරොන්දුව
ද ඉටු
කරනු ඇත.
දෙවියන්
වහන්සේ
සැමවිටම
එතුමාණන්ගේ පොරොන්දු
රක්ෂා කරන සේක.

දෙවියන් වහන්සේ ආබ්‍රහම් හට දුන් පොරොන්දුව

## දේව වචනයෙන් එක් කථාවක්

## බයිබලයේ

උත්පත්ති 11-21

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විදිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)